## වැඩිහිටි නිවාසගත වැඩිහිටියන් සඳහා වන්දනා චාරිකා වෙනුවෙන් ආධාර මුදල් ලබාදීම- 2024

- **හැඳින්වීම**

දිවයින පුරා ජීවත්වන වැඩිහිටි ප්‍රජාව අතරින්, කිසිදු හවිහරණක් නොමැතිව ඉතාමත් අසරණ තත්ත්වයට පත්ව සිටන වැඩිහිටියන්හට අස්වැසිල්ලක් සපයමින් ඔවුන්ට ජීවත්වීමට ඉඩ ප්‍රස්ථා සලසා දීම වැඩිහිටි නිවාස මගින් සිදුකරනු ලබයි. මෙම වැඩිහිටියන්ගේ අධ්‍යාත්මික හා මානසික සුවය සංවර්ධනය කිරීමේ අරමුණින් යුතුව, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් වැඩිහිටි නිවාසගත වැඩිහිටියන් වෙනුවෙන් වන්දනා චාරිකා සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම මෙම වැඩසටහන මගින් සිදුකරනු ලබයි.

### ඉල්ලීම් ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක ක්‍රමවේදය

01. දිස්ත්‍රික් ලේකම් බලප්‍රදේශ / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස වල වැඩිහිටියන් වෙනුවෙන් සංවිධානය කරනු ලබන වන්දනා චාරිකා සඳහා ආධාර ලබාගැනීමට ඉල්ලුම් කළ හැකිය. 2024 වර්ෂය සඳහා **අගෝස්තු 31** දින දක්වා ඉල්ලීම් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

02. අදාල වැඩිහිටි නිවාසය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ලියාපදිංචි වැඩිහිටි නිවාසයක් විය යුතු අතර, ඒ ඒ නිවාස සඳහා ආධාර ලබාදීම සුදුසු බවට විෂය නිලධාරි විසින් නිර්දේශ කළ යුතුය.

03. යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තුළ පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස සංඛ්‍යාව හා ඒවායෙහි සිටින වැඩිහිටියන් සංඛ්‍යාව, එක් වන්දනා චාරිකාවක් සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවන් වලදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයක් සම්බන්ධකර දිස්ත්‍රික් ලේකම් මගින් ඉල්ලීම් කළ හැකිය. මෙවැනි අවස්ථාවලදී මෙම ඉල්ලීම් සම්බන්ධ සියලුම සම්බන්ධීකරණ කටයුතු දිස්ත්‍රික් විෂය නිලධාරී විසින් සිදුකළ යුතුය.

04. ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන වැඩිහිටි නිවාසය නොමිලේ පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසයක් වියයුතු අතර, ඒ බව ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් විසින් තහවුරු කළ යුතුය.

05. අවම වශයෙන් වැඩිහිටියන් 30 **දෙනෙකුවත්** එක් චාරිකාවක් සඳහා සහභාගිවිය යුතු අතර, සහභාගිවන වැඩිහිටියන්ගේ නාමලේඛණයක් ඉදිරිපත් කළ යුතුය.

06. එක් වැඩිහිටි නිවාසයක් තුළ සහභාගිවන වැඩිහිටියන් සංඛ්‍යාව 30 දෙනෙකුට අඩුවන්නේ නම්, මේ සඳහා නිවාස කිහිපයක් සම්බන්ධ කරගත හැකිය.

07. මෙම වැඩසටහන යටතේ ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී, මෙතෙක් ආධාර ලබා නොමැති වැඩිහිටි නිවාස සඳහා ප්‍රමුඛතාව ලබාදිය යුතුය.

08. වන්දනා වාරිකාව යන ප්‍රදේශය, ගමන් මාර්ගය, ගමන යාමට යෝජිත දිනය ඇතුළත් ඉල්ලීම් ලිපියක් අදාල වැඩිහිටි නිවාසයේ **පාලක /පාලිකා** විසින් දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළ යුතු අතර, එම ලිපිය ඉල්ලීම සමග ඉදිරිපත් කළ යුතුය.

09. වන්දනා වාරිකාවට අදාල ඇස්තමේන්තුව අදාල වැඩිහිටි නිවාසයේ පාලක/පාලිකාවගේ සම්බන්ධීකරණයෙන් යුතුව විෂය නිලධාරි විසින් සකස්කර ඉදිරිපත් කළ යුතුය.

10. ඒ අනුව, ඉහත සඳහන් පරිදි අවශ්‍ය ලිපිලේඛණ සමග අදාල දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් විසින් මේ සඳහා වන ඉල්ලීම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

11. ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලා රු. 75,000/- ක උපරිමයකට යටත්ව ආධාර මුදල් ලබාදෙනු ලබන අතර, එම මුදල් වාරිකාව වෙනුවෙන් වන වියදම් සඳහා පමණක් වියදම්කළ යුතුය.

12. අදාල මුදල්, චෙක්පත් මගින් දිස්ත්‍රික් ලේකම්වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබාදෙනු ලබන අතර, එම චෙක්පත සඳහා වන ලදුපත (පොදු 172 ආකෘතිය) කඩිනමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

13. අදාල වන්දනා වාරිකාව අවසන් වූ පසු ඒ සම්බන්ධ, වැඩිහිටි නිවාසයේ **පාලකගෙන් /පාලිකාවගෙන්** සම්බන්ධීකරණයෙන් යුතුව විෂය නිලධාරි විසින් සකස්කරන ලද වියදම් වාර්තාව, (මුදල් වියදම්කරන ලද ආකාරය පැහැදිලිව ඉදිපත් කළ යුතුය) හා ඡායාරූප සහිතව, කඩිනමින් මා වෙත ඉදිපත්කළ යුතුය.

14. ඉහත කරුණු අනුව මෙම ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් ලේඛණ ද ඉදිරිපත් කළ යුතුය.

- අදාල වැඩිහිටි නිවාසය ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද පිටපතක් හෝ ඒ බව තහවුරු කෙරෙන ලිපිය
- වැඩිහිටි නිවාසය නොමිලේ පවත්වාගෙනයනු ලබන බවට ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කරනු ලබන තහවුරුව.
- ආධාර ලබාදීමට සුදුසු බවට වන විෂය නිලධාරි වාර්තාව .
- සහභාගිවන වැඩිහිටියන්ගේ නාමලේඛණය.
- ප්‍රදේශය, ගමන් මාර්ගය, ගමන යාමට යෝජිත දිනය ඇතුළත්, වැඩිහිටි නිවාසයේ පාලක/පාලිකා විසින් ප්‍රාදේශීය ලේකම් වෙත යොමුකරන ලද ඉල්ලීම් ලිපිය .
- විෂය නිලධාරි විසින් සකස්කරන ලද දළ වියදම් ඇස්තමේන්තුව.

කේ.ජී. ලැනරෝල්
අධ්‍යක්ෂ